ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2512/47 – 2026 ඔක්තෝබර් මස 31 වැනි සෙනසුරාදා – 2026.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

පඩිපාලක සහා ආඥාපනත

නිවේදනයයි

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ ගරු කම්කරු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තියෙහි විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය මෙම *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත් කරනු ලබන දින සිට වලංගු විය යුතුය.

එස්. එම්. පියතිස්ස,
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 05,
"මෙහෙවර පියෙස" දී ය.

1A – G 048439 – 08 (2026/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 99/71 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2018 සැප්තැම්බර් මස 25 වැනි දින අංක 2090/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

කැලි මිම්මේ සේවකයින්ට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණය මෙසේය -

	කාර්යය	*පඩි ප්‍රමාණය* *රු. ශත*
(1)	වැවිල්ල දැමීම හා නඩත්තු කිරීම, පොල් කැඩීම ගස් 1000 ක	5,400.00
(2)	කොප්පරා තැනීම, පොල් ලෙලි ගැසීම, පොල් බිඳීම, කොප්පරා වේලීම හා තේරීම ගෙඩි 1000 ක	1,450.00

III වන කොටස

	කාර්යය	*පඩි ප්‍රමාණය* *රු. ශත*
(අ)	පොල් වැවිල්ලක් වගා කිරීම හා පවත්වා ගෙන යාම	1,350.00
(ආ)	කොප්පරා සෑදීම	
	ඉහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ සියලු කම්කරුවන් සඳහා දිනකට	

ගව පාලනයේ නිරත යම් සේවකයෙකුට වැඩ වේලා සඳහා ඉරිදාට ගෙවිය යුතු පඩි ප්‍රමාණය විය යුත්තේ මෙම කොටසේ කලින් දී ඇති විධිවිධානවලට ඇතුළත් කිසියම් ප්‍රතිවිරෝධී කරුණකින් ප්‍රතිශෝධනය නොවූ වැඩ කරන සාමාන්‍ය දවසකට එබඳු සේවකයෙකුට ගෙවිය යුතු පඩි ප්‍රමාණය මෙන් එකහමාර ගුණයකි.

III "ඒ" වන කොටස

කාර්යය		
(අ) කොන්දොස්තර කෙනෙකුගේ වැඩවලට, (ආ) මුරකරුවෙකුගේ වැඩවලට, අදාළ කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ		
අක්කර ප්‍රමාණය	*මුරකරු* *රු. ශත*	*කොන්දොස්තර* *රු. ශත*
(1) අක්කර 10 ට නොඅඩු එහෙත් අක්කර 25 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම්	33,750.00	–
(2) අක්කර 25 නොඅඩු එහෙත් අක්කර 50 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම්	34,750.00	35,250.00
(3) අක්කර 50 ට වැඩි පොල් වැවිල්ලක් හෝ කොටසක නම්	35,750.00	36,250.00

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.